ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2024.06.12


පැමිණිලි පාර්ශවය : යූ.කේ.යූ. සිසිර කුමාර මයා,
122 ඒ, උඩුපිල,
දෙල්ගොඩ.

වගඋත්තර පාර්ශවය : සාමාන්‍යාධිකාරී,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ,
තිමාව, කොලොන්නාව.

පැමිණිලි අංකය : HRC/2732/21

පැමිණිල්ලෙන් දක්වා සිටින කරුණු =:

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා වගඋත්තරකාර ආයතනයේ සේවය කරන බවත්, ආරක්ෂක විධායක තනතුරට සුදුසු තැනැත්තන් තෝරා පත් කර ගැනීම සඳහා 2021.10.13, 14 සහ 29 දිනවල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී තමාට හිමිවිය යුතු ලකුණු අහිමි කිරීමෙන් ඉහත සදහන් තනතුර ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත්ය. ආරක්ෂක විධායක තනතුරට අදාල සම්මුඛ පරීක්ෂණයේදී තමාට ලකුණු 59.66ක් ලබා දී ඇති අතර, වාර්ෂික ඇගයීම් සඳහා ලකුණු 15.33ක් ලබාදිය යුතු වුවද ඒ සඳහා 14.66ක් පමණක් ලබා දී ඇති බවත්, බාහිර සුදුසුකම් වලට ලකුණු 10ක් ලැබියයුතු වුවද, ඒ සඳහා ලකුණු 07ක් පමණක් ලබාදීමෙන් අසාධාරණයකට ලක් කළ බවත් පැමිණිල්ලෙන් දක්වා තිබේ.

තවද මෙම සම්මුඛ පරීක්ෂණය ZOOM තාක්ෂණය ඔස්සේ පැවැත්වූ බවත්, තමාට වඩා අඩු සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට උසස්වීම් හිමි වන ආකාරයට ලකුණු ලබාදී ඇති බවත්, දක්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් 2022.12.22 දින ආයතනයේ සභාපතිතුමා වෙත අභියාචනාවක් ඉදිරිපත් කළද මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ මෙම පැමිණිල්ල ගොනු කරන දින දක්වාම ආයතනය විසින් කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com





දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම =:

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ලිඛිත කරුණු දැක්වීමට අනුව, ආයතනයේ ආරක්ෂක කාර්යාංශයේ A-7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක තනතුරට සුදුස්සන් තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවූ බවත්, එම තනතුර සඳහා ඇබෑර්තු 05 ක් පැවැති අතර, අයදුම්කරුවන් 25ක් ඉල්ලුම් කර තිබියදී සුදුසුකම් ලැබූ ගණන 22ක් වූ බවත්, කොවිඩ් වසංගත තත්ත්වය පැවති කාල සීමාවේ මෙම සම්මුඛ පරීක්ෂණය ZOOM තාක්ෂණය ඔස්සේ 2021.10.13, 14 හා 29 යන දිනයන්හි දී පැවැත්වූ බව ද දක්වා ඇත. අනුමත ලකුණු පටිපාටිය අනුව සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද සලකා බලා ඔවුන් ලබාගත් ඉහළ ලකුණු ලද අයදුම්කරුවන් 05 දෙනෙකු එකී තනතුරට පත් කර ගත් බව ද දන්වා සිටී.

පැමිණිලිකරුගේ අධ්‍යාපන සුදුසුකම්, වාර්ෂික වැටුප් වර්ධක, ජ්‍යෙෂ්ඨත්වය පාඨමාලා වෙනුවෙන් පිරිනැමෙන ලකුණු හා වෙනත් සුදුසුකම් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලබාදුන් ලකුණු ද සමග මුළු ලකුණු 59.66%ක් ලබාගෙන ඇති බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කටයුතු කර ඇති ආකාරය අනුව ඔහුට හිමිවිය යුතු ලකුණු ලබාදී ඇත්තේ සියළු සුදුසුකම් පරීක්ෂා කර බලා සාධාරණව බව උක්ත වාර්තාවෙන් වැඩිදුරටත් දක්වා තිබේ.

පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු =:

මෙම පැමිණිල්ලට අදාලව දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් පරීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර, එහිදී ඉදිරිපත් වී ඇති කරුණු අනුව, පැමිණිලිකරුගේ වෙනත් කුසලතා සඳහා ලකුණු ලබාදිය හැකි අවස්ථාවක් වන ඔහු ගුවන් හමුදා සේවයේ යෙදී සිටි සහතිකය වෙනුවට දෙමළ භාෂාව සම්බන්ධව පවත්වන ලද පාඨමාලාවක් අවසානයේ ලද සහතිකය සඳහා ද කාර්යක්ෂමතා ඇගයීම් සඳහා වැටුප් වර්ධක අනුව හිමි ලකුණු ද නිවැරදිව ලබාදී නොමැති බව අනාවරණය වී ඇත. ඒ අනුව මේ පිළිබඳ දක්වා පැමිණිලිකරු විසින් සිදුකර ඇති අභියාචනය වගඋත්තරකරුවන් විසින් සලකා බලා නොමැති බව ද පෙනී යයි.

ඉහත කී කාරණය සම්බන්ධයෙන් 2023.05.15 දිනැති වාර්තාව මගින් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරුවන් සඳහන් කර සිටින්නේ, ගුවන් හමුදාවේ පැමිණිලිකරුට අදාළ සේවා කාලය සම්බන්ධව ලද සහතිකයට කුසලතා සඳහා ලකුණු ලබාදිය හැකි වුවද එය නොසලකා හැර තිබීම යන්න තරයේ ප්‍රතික්ෂේප කරන බවත්, ලකුණු ලබාදීම ලකුණු ලබාදිය යුතු කාර්ය පටිපාටිය අනුව සිදුකර ඇති බවත්ය.. එසේම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය අනුව ලකුණු ලබාදිය යුතු සහතික මොනවාද යන්න තීරණය වන බව ද මෙම තනතුරට අදාලව ලකුණු ලබාදීමේදී සලකා බලනුයේ එම අත්‍යාසන්න වසර වල ලබාගත් සහතික බව ද වැටුප් වර්ධක වෙනුවෙන් හිමි ලකුණු ලබාදී තිබියදී ඒවා ලබා නොදුන් බවට කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවද කියා සිටී. ඒ අනුව පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නොසලකා හැරීමක් සිදු කර නොමැති බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කරයි.

පැමිණිලිකරු 2023.10.07 දින ලිඛිතව කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර සිටින්නේ, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එවන ලද ලිපිය තුලින් වගඋත්තරකරු විසින් අසත්‍ය කරුණු දක්වා ඇති බවත්, සම්මුඛ පරීක්ෂණය ZOOM තාක්ෂණය ඔස්සේ පැවැත්වූ හඬ පටය ආයතනයේ සභාපතිතුමා වෙත ඉදිරිපත් කළ පසු අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගෙන කොමිෂන් සභාවේ පරීක්ෂණය අවසන් කර තීරණයක් ලබාදෙන තුරු 2023.06.14 වන දින සිට ආරක්ෂක විධායක තනතුරේ වැඩ බැලීම සිදු කිරීමට ලිපියක් නිකුත් කර ඇති බවත්ය. ඒ අනුව දැනට වැඩ බලන ආරක්ෂක විධායක ලෙස තමා කටයුතු කරන බව ද පැමිණිලිකරු පෙන්වා දී තිබේ.

තීරීක්ෂණ =:

1. වගඋත්තර ආයතනයේ ආරක්ෂක කාර්යාංශය විසින් A-7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී පැමිණිලිකරුද අයදුම්පතක් යොමු කර ඇති අතර, එම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා 2021 වර්ෂයේ ඔක්තොම්බර් මස 13, 14 සහ 29 යන දිනවල පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකරු පෙනී සිට ඇත.

2. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේදී වාර්ෂික ඇගයීම් සඳහා ලකුණු 14.66 ක් පැමිණිලිකරුට ලබා දී ඇත. වාර්ෂික ඇගයීම් සඳහා ලකුණු ලබා දීමේදී වගඋත්තර පාර්ශවය විසින් 2019, 2020 සහ 2021 වසර වලදී පැමිණිලිකරු විසින් ලබාගෙන ඇති ලකුණු සලකා බලා ඇති අතර, ඒ අනුව වාර්ෂික ඇගයීම් සඳහා පැමිණිකරුට ලකුණු 15.33 ක් හිමිවිය යුතු බව පහත පරිදි දැක්විය හැකිය.

| වර්ෂය | වාර්ෂික ඇගයීම් ලකුණු |
|---|---|
| 2019 | 21 |
| 2020 | 24 |
| 2021 | 24 |

මුළු ලකුණු ප්‍රමාණය = 21 + 24 + 24 = 69

(69/3) x (1/30) x 20 = 15.33

ඒ අනුව පැමිණිලිකරුට අහිමිව ඇති ලකුණු ප්‍රමාණය = 15.33- 14.66 = 0.67

3. සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් විසිදෙනා අතරින් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව (performance at the interview) සඳහා අවම ලකුණු හිමිව ඇත්තේ පැමිණිලිකරුට වන අතර, එම ලකුණු ප්‍රමාණය ලකුණු 20න් ලකුණු 05කි. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව සඳහා ලකුණු ලබාදීමේදී පැමිණිලිකරු හැර අනෙකුත් සියලු අයදුම්කරුවන්ට අවම වශයෙන් ලකුණු 07ක් හෝ ලබාදී ඇත. තෝරාගෙන ඇති අයදුම්කරුවන් පස්දෙනාට 18, 17 සහ 14 ලෙස උපරිම ලකුණු ලබාදීමක් සිදුකර ඇති අතර, පැමිණිලිකරුට පමණක් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා ලකුණු 5ක් වැනි අවම ලකුණු ප්‍රමාණයක් ලබාදීම ගැටළුසහගත බව නිරීක්ෂණය වේ.

4. මෙම තනතුර සඳහා තෝරාගෙන ඇති අයදුම්කරුවන් පස්දෙනා විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගෙන ඇති මුළු ලකුණුවලින් (Total marks) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා ලබාදුන් ලකුණු (Marks given for the performance at the interview) අඩු කළ විට ලැබෙන ලකුණු ප්‍රමාණය, ඒ ආකාරයට ම පැමිණිලිකරු වෙනුවෙන් ද ගණනය කර සසඳා බැලීමේදී අදාළ තනතුර සඳහා තෝරාගෙන ඇති සියළු අයදුම්කරුවන්ට වඩා ඉදිරියෙන් පැමිණිලිකරු සිටින බවත්, ඔහුට වැඩි ලකුණු ප්‍රමාණයක් හිමිව ඇති බවත් නිරීක්ෂණය වේ.

5. ඒ අනුව, මූලික අධ්‍යාපන සුදුසුකම්, වාර්ෂික ඇගයීම්, ජ්‍යෙෂ්ඨතාවය, අමතර සුදුසුකම් සහ විෂය බාහිර කටයුතු සඳහා පැමිණිලිකරුට ලකුණු 54.66ක් හිමිව ඇති නමුත් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා ලකුණු 5ක් වැනි අවම ලකුණු ප්‍රමාණයක් හිමිව ඇත. තනතුර සඳහා තේරී පත්ව ඇති අනෙකුත් සියලු අයදුම්කරුවන් විසින් මූලික අධ්‍යාපන සුදුසුකම්, වාර්ෂික ඇගයීම්, ජ්‍යෙෂ්ඨතාවය, අමතර සුදුසුකම් සහ විෂය බාහිර කටයුතු සඳහා පිළිවෙලින් 53.22, 50.94, 45.33, 48.22 සහ 44.16 ලෙස ලකුණු ලබාගෙන ඇති නමුත් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා 14,17,18 ලෙස ලකුණු ලබා දීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

6. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වූ අයදුම්කරුවන් අතරින් තනතුර සඳහා තෝරාගෙන ඇති පස්දෙනාගේ ලැයිස්තුවේ පස් වන තැනැත්තාගේ ලකුණු වන්නේ 62.16%කි. පැමිණිලිකරුගේ ලකුණු වන්නේ 59.66%කි. ඒ අනුව, තෝරාගත් අයදුම්කරුවන් අතරින් පස්වැනියාට තෝරාගෙන ඇති අයදුම්කරු විසින් ලබාගත් ලකුණු ප්‍රමාණය සහ පැමිණිලිකරු විසින් ලබාගත් ලකුණු ප්‍රමාණය අතර වෙනස ලකුණු 03ක් වැනි අවම ලකුණු ප්‍රමාණයකි.

7. ඒ අනුව, වාර්ෂික ඇගයීම් සඳහා ලබා දී ඇති ලකුණු 14.66 වෙනුවට ලකුණු 15.33ක් ද, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව සඳහා පැමිණිලිකරුට ලබාදිය යුතුව තිබූ ලකුණු ප්‍රමාණය ද ලබාදුන්නේ නම් පැමිණිලිකරු A - 7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය වේ.

8. එසේම සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරු ලබා තිබූ දෙමළ භාෂා අධ්‍යයන සහතිකයට ලකුණු ලබා දී නොමැත. එකී සහතිකයේ "Participation" ලෙස සඳහන් වන අතර, සහභාගීත්වය සඳහා ලකුණු ලබාදීමක් සිදු නොකරන බව වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇත. එහෙත් මාස 06ක කාල සීමාවක් තුළ යම් 'නිපුණතාවක්' ලැබීම සහතිකයකින් ඔබ්බට ගිය පුහුණුවක් වන බව හා 'ඩිප්ලෝමා' වැනි පුහුණුවක් වන බව පිළිගැනීමයි. එම සහතිකයට ලකුණු ලබා දුන්නේ නම් තවත් ලකුණු 03ක් පැමිණිලිකරුට හිමිවේ. කෙසේ වෙතත් මෙම අවස්ථාවේ එම සහතිකයට ලකුණු ලබා නොදීම පිළිබඳව කොමිෂන් සභාව අවධානය යොමු කළ ද මෙම නිර්දේශයේදී එය නොතකා අනෙකුත් කරුණු මත නිර්දේශ ලබාදීමට කටයුතු කරනු ඇත.

9. පැමිණිලිකරු ඒ - 7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක් නිලධාරී තනතුරෙහි වැඩබැලීම සඳහා පත්කර 2023.06.14 දින සිට 2023.09.13 දින දක්වා ද, 2023.09.14 දින සිට 2023.12.13 දින දක්වාද, 2023.12.14 දින සිට 2024.03.13 දින දක්වාද, 2024.03.14 දින සිට 2024.06.13 දින දක්වාද සිව් වතාවකදී එකී පත්කිරීම දීර්ඝ කර ඇති අතර, එකී තනතුර සිව් වතාවකදී දීර්ඝ කිරීම මගින් පැමිණිලිකරුගේ සේවය සම්බන්ධව වගඋත්තර ආයතනය සෑහීමකට පත්වන බව ද වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

නිගමනය =:

ඉහත නිරීක්ෂණ වලට අනුව, වගඋත්තර ආයතනය විසින් පැමිණිලිකරුට A -7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක තනතුර සඳහා පත්වීම ලබා දීමට කටයුතු නොකිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.

1. A-7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරුට හිමිවිය යුතුව තිබූ ලකුණු අහිමි කිරීම මත ඔහුට අහිමි වූ A-7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක තනතුර 2021.10.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දීමට කටයුතු කළ යුතුය.

2. 2021.10.29 දින සිට පැමිණිලිකරු A-7 ශ්‍රේණියේ ආරක්ෂක විධායක තනතුරේ නියමිත වැටුප් පියවරෙහි පිහිටුවා මේ දක්වා ඔහුට අදාළ වැටුප් පියවර හා එකී තනතුරට හිමි වෙනත් වරප්‍රසාද ලබා දිය යුතුය.

2024. 07.16 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත =: අමාත්‍යතුමා,
විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය,
437, ගාලු පාර, කොළඹ 03.

B/RAT